ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2023-01-09 |

පැමිණිලි පාර්ශවය : ඩබ්.එම්.පී.එම්.බී.වීරක්කොඩි මහතා,
අංක. 51/9, ඇල්වල,
උකුවෙල.

වගඋත්තර පාර්ශවය : 01. මූලස්ථාන පොලිස්ථානාධිපති,
මූලස්ථාන පොලිස් ස්ථානය,
මාතලේ.

02. උ.පො.ප.ඒකනායක මහතා,
මූලස්ථාන පොලිස් ස්ථානය,
මාතලේ.

<u>පැමිණිලි අංකය : HRC/1746/20/A</u>

**පැමිණිලි පාර්ශවයේ සැළකිරීම :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන පැමිණිලිකරුගේ සොහොයුරිය වන නීතිඥ ධරණි මේසිකා මිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මාදුරුඔය විශේෂ කාර්ය බලකා පුහුණු පාසලේ කපිතාන්වරයෙකු ලෙස සේවය කරන තම බාල සහෝදරයා වන වීරක්කොඩි මුදියන්සේලාගේ පුෂ්පිත මේස බණ්ඩාර වීරක්කොඩි යන අය, මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවට සහභාගී විම සඳහා එක්දින විශේෂ නිවාඩුවක් ලබාගෙන පැමිණි අවස්ථාවේ, මාතලේ පොලිසියේ සීඅයිඩී නිලධාරින් යැයි කියාගත් සිවිල් ඇඳුමින් සැරසී සිටි පුද්ගලයින් පිරිසක් විසින් මාතලේ දිසා මහේස්ත්‍රාත් අධිකරණ භූමිය තුළදී ඔහුව අත්අඩංගුවට ගෙන බෙල්ලෙන් අල්ලා, ඇදගෙන ගොස් ත්‍රිරෝද රථයකට නංවාගෙන ඇති බවත්, ඉන්පසු ඔහු මාතලේ පොලිසිය වෙත රැගෙන ගොස් ඇති අතර එස්.අයි ඒකනායක නැමැති නිලධාරියා විසින් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති බවත්ය.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு: 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

තමාගේ සහෝදරයා අත්අඩංගුවට ගත් වහාම තමාද මාතලේ පොලිසිය වෙත ගිය බවත්, තම සහෝදරයාගෙන් බලහත්කාරයෙන් ප්‍රකාශයක් ලබාගෙන ඇති අතර, එයට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරන විට එසේ සිදුකිරීමට බලයක් නොමැති බව පවසා ඊට විරුද්ධව නඩු දමන බවට තර්ජණය කර සිටි බවත්, තමා ඉදිරියේ නැවත ප්‍රකාශයක් සටහන් කර ගත් බවත් දක්වා ඇත. තම සහෝදරයා අත්අඩංගුවට ගත් හේතුව විමසා සිටිමේදී උ.පො.ප.ඒකනායක නිලධාරී විසින්, 2020.07.25 වන දින රාත්‍රියේ 'හයිවේ හොලිඩේ රිසෝට්' නම් ස්ථානයට ඇතුළු වී එහි සේවකයින්ට පහරදීම හා බඩු පොඩිකිරිමට අදාළව අත්අඩංගුවට ගෙන ඇති බවත්, නමුත් එම සිද්ධිය සිදුවූ දිනයේ තමාගේ සහෝදරයා මාදුරුඔය විශේෂ කාර්යය බලකා පුහුණු පාසලේ සිටි බව දැක්වෙන එහි අණදෙන නිලධාරි විසින් නිසිපරිදි අවසර ලබාගෙන නිකුත් කරන ලද ලිපියේ ඡායා පිටපතක් ඔහු සතුව තිබූ බවත්, එය පොලිස් නිලධාරින්ට පෙන්වා ඇති බවත්, තමා අදාළ සිදුවීම සිදුවූ දින මාදුරුඔය විශේෂ කාර්ය බලකා පුහුණු පාසලේ සිටි බවට මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටිමින් දිවුරුම් ප්‍රකාශයක්ද ලබාදී ඇති බවත්, ඒ සම්බන්ධව ග්‍රාමසේවා නිලධාරි මගින් හා මාදුරුඔය විශේෂ කාර්ය බලකා පුහුණු පාසලේ අණදෙන නිලධාරිගෙන් දුරකථන ඇමතුමක් ලබාගෙන තහවුරු කරගත යුතු මූලස්ථාන පොලිස් පරික්ෂක විසින් මහේස්ත්‍රාත්තුමා වෙත කරුණු ඉදිරිපත් කළ බවත් දක්වා ඇත.

එසේ 2020.07.31 දින සිට දින 17ක් ගතවූවද ඒ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරිගෙන් හෝ අණදෙන නිලධාරි වෙතින් කිසිඳු විමසිමක් සිදුකර නොමැති බවත්, තම සහෝදරයා ස්වේච්ඡාවෙන්ම ඉල්ලීමක් කර අදාළ දින කඳවුරේ තමා සිටි බවට අණදෙන නිලධාරි වෙතින් ලිපියක් ලබාගෙන ඇති බවත්, එය 2020.08.17 වන දින මෝසමක් මගින් ගරු අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර ඇත.

ඒ සම්බන්ධයෙන් කරුණු තහවුරු කරගැනීමට මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණි අවස්ථාවේ සී.අයි.ඩී නිළධාරින් යැයි කියාගත් පිරිසක් විසින් තම බාල සහෝදරයා වන පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් සඳහා බන්ධනාගාර ගතකර ඇති බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදි තම සහෝදරයාගේ බෙල්ලෙන් අල්ලා ඇඳගෙන යමින් කෲර සහ අමානුෂික ලෙස කටයුතු කළ බවත්, තම සහෝදරයා පොලීසිය හරහා වෛද්‍යවරයෙක් වෙතද ඉදිරිපත් කිරිමට කටයුතු කළ බවත්, මෙලෙස අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම සම්බන්ධව පරික්ෂණයක් පවත්වා සහන සැලසිමට කටයුතු කරන ලෙස පැමිණිල්ලෙන් දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-**

පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවය වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, 2020.07.25 වන දින 119 දුරකථනයට ඇල්වල 'හයිවේ රිසෝට් හොලිඩේ' හෝටලයට පුද්ගලයින් පිරිසක් ඇතුල් වී පහරදී දේපලවලට අලාභහානි සිදුකරන බවට තොරතුරක් ලැබුණු බවත්, ඒ වන විට 119 අංශයේ රාජකාරියේ යෙදී සිටි උ.පො.ප.ප්‍රේමරත්න ඇතුළු නිලධාරින් කණ්ඩායමක් එම ස්ථානයට ගොස් මූලික විමර්ශන ආරම්භ කළ බවත්ය. පොලිස් නිලධාරින් එම ස්ථානයට යන විටත් හෝටලයේ දේපලවලට හා එහි සේවකයින්ට පහරදුන් පුද්ගලයින් පලා ගොස් සිටි අතර, උ.පො.ප.ප්‍රේමරත්න නිලධාරියා විසින් හෝටලයේ දේපලවලට පහරදීමට

අදාළ නිරීක්ෂණ සටහන් කරගෙන ඇති බවත්, සිද්ධිය වන අවස්ථාවේ හෝටලයේ හිමිකාරිණියගේ දියණිය රැඳී සිට ඇති අතර, ඇයගෙන් ප්‍රකාශයක්ද සටහන් කරගෙන ඇති බවත් සඳහන් කර ඇත.

එකී ප්‍රකාශයට අනුව තම සහෝදරයා හා හෝටලයට පිටතින් පැමිණි පිරිසක් අතර බහින් බස්වීමක් සිදු වු බවත්, ඉන් මද වේලාවකට පසු හෝටලය ආසන්නයේ පදිංචි වීරක්කොඩි හා ඔහුගේ පුතෙකු සහ තවත් නොහඳුනන පුද්ගලයින් තිදෙනෙකු හෝටලයට පැමිණ තම සහෝදරයාට හා දේපලවලට පහරදුන් බවත්, ඒ අනුව අපරාධය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකර සැකකරුවන් අතරින් වීරක්කොඩි මුදියන්සේලාගේ නිහාල් වීරක්කොඩි යන අය 2020.07.26 වන දින පො.ප.සුසන්ත ද සිල්වා නිලධාරියා විසින් සිද්ධිය සම්බන්ධයෙන් වරද කියා දී අත්අඩංගුවට ගැනිමට කටයුතු කර ඇති බවත්, ඉන්පසු මාතලේ මහේස්ත්‍රාත් උසාවියේ බී.887/20 යටතේ ගරු අධිකරණයට කරුණු වාර්තා කළ බවත් දක්වා ඇත.

මෙකී සැකකරුගෙන් ප්‍රකාශ සටහන් කිරීමේදී තමන් සමඟ සිද්ධියට සම්බන්ධ අනෙකුත් පිරිස පිළිබඳව හා සිද්ධියට සම්බන්ධ ඔහුගේ පුතා කවරෙක්ද යන්න විමසා සිටි නමුත් එම විස්තර ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති බවත්, අදාළ ප්‍රකාශයට අත්සන් කිරීමද ඔහු විසින් ප්‍රතික්ෂේප කර ඇති බවත්, සැකකරුගේ ක්‍රියාකලාපය අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු දින 14 ක් දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකළ බවත්, මෙකී සිද්ධිය සඳහා සැකකරුවන් පස්දෙනෙකු සම්බන්ධ බවට විමර්ශන වලදී අනාවරණය වී තිබූ හෙයින් ඉදිරි සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට නියමිතව තිබූ බවත්, නොහඳුනන සැකකරුවන් තිදෙනාට අමතරව වීරක්කොඩි යන අයගේ පුතෙකු සිටින බව මුල් පැමිණිල්ලේම සඳහන් වූ හෙයින් එම අය අත්අඩංගුවට ගැනීමට සොයා බැලීමේදී පොලිසිය මඟහැර පලා ගොස් සිටි බවත්, ඒ වන විට වීරක්කොඩි යන අයට පිරිමි දරුවන් දෙදෙනෙකු සිටින බවත්, ඔවුන් එක හා සමාන බවත්, 2020.08.02 උ.පො.ප.නවරත්න නිලධාරියා යොදවා වීරක්කොඩි යන අයගේ බිරිඳගෙන් මෙම සිද්ධිය සම්බන්ධයෙන් පුතා පිළබඳ තොරතුරු විමසුවද ඇය විසින් නිසි පිළිතුරු ලබානොදීමත් ප්‍රකාශයට අත්සන් නොකිරිමටත් කටයුතු කර ඇති බවත්, වසමේ ග්‍රාම නිලධාරි වෙතින් විමසීමේදි වීරක්කොඩි යන අයට පිරිමි ළමයින් දෙදෙනෙකු සිටින බවත් එක් අයෙක් හමුදාවේ සේවය කරන බවත්, අනෙක් දරුවා රැකියාවක් නොකරන බවද සනාථ කරගත් නමුත් මෙම අපරාධයට සම්බන්ධවූයේ කවුරුන්ද යන්න තොරතුරක් නොමැති බවත් දක්වා ඇත.

2020.08.07 දින උ.පො.ප.ඒකනායක නිලධාරියාගේ පුද්ගලික ඔත්තුකරුවකු විසින් මෙම සිද්ධියට සම්බන්ධ වීරක්කොඩිගේ පුතා ඇඳ සිටින රෙදිපිළි ආදිය ඇතුළු විස්තර සපයමින් අධිකරණ සංකීර්ණය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ ගමන් ගන්නා බවට ලද තොරතුරක් මත අදාළ පොලිස් නිලධාරියා ඔහුගෙන් කරුණු විමසා ඇති අතර, ඔහු වීරක්කොඩි බවට හඳුන්වාදුන් නමුත් නීතිඥ සහායක් නොමැතිව ඉන් එහාට කිසිදු විස්තරයක් සැපයිය නොහැකි බව දන්වා ඇති බවත්, ඔහු සන්තකයේ ඒ වන විට මාදුරුඔය විශේෂ බලකා යුධහමුදා කඳවුරේ අණදෙන නිලධාරි විසින් නිකුත් කරන ලද ලිපියක් තිබූ බවත්, එහි එකී අපරාධය සිදුවූ දින මෙම අය එම කඳවුරේ සේවය කළ බවට සඳහන්ව තිබූ බවත්, ඉහත අය විසින් එසේ ලිපියක් රැගෙන ඒම සම්බන්ධයෙන් විමර්ශන නිලධාරියාට සැකයක් මතුවීම හේතුවෙන්, වීරක්කොඩි මුදියන්සේලාගේ පුෂ්පිත මේස බණ්ඩාර වීරක්කොඩි යන අය 2020.08.17 දින පැය 9.40 ට උ.පො.ප.ඒකනායක නිලධාරියා විසින් අධිකරණ

සංකීරණය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේදී අදාළ සිද්ධිය සම්බන්ධයෙන් කරුණු කියාදී අත්අඩංගුවට ගත් බවත් දක්වා ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් මෙම පුද්ගලයාගෙන් ප්‍රශ්න කර ඇති නමුත් ඒ පිළිබඳව කිසිදු කරුණක් ඉදිරිපත් නොකර සිටි බවත්, ඔහු විසින් එකී සිද්ධිය සිදුවූ කාල සීමාව තුළ කඳවුරේ බැරැක්කය තුල සිටි බවට අණදෙන නිලධාරිගේ අත්සන සහිත ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, මෙම සිද්ධියේදී අදාළ සැකකරු කවුරුන්ද යන්න නිශ්චිතව හඳුනාගැනීමට අපරාධයට සම්බන්ධ සැකකාර වීරක්කොඩි යන අයගේ පුතා කවුරුන්ද යන්න අනාවරණය කරගැනීම සඳහා අත්අඩංගුවට ගත් නිලධාරියා විසින් සාධාරණ සැකය මත සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් බවට තහවුරු කර ඇති බවත්ය.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණය වී ඇති කරුණු :-**

01. 2020.07.25 වන දින මාතලේ ඇල්වල පිහිටි ඇල්වල 'හයිවේ රිසෝට් හොලිඩේ' හෝටලයට පහරදී දේපලවලට හානිකිරීම සම්බන්ධයෙන් මාතලේ පොලිසියට සිදුකරන ලද පැමිණිල්ලකට අනුව පොලිසිය විසින් අදාළ සිද්ධියට සැකපිට පැමිණිලිකරුගේ පියා 2022.07.26 දින අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇත.

02. අදාළ හෝටලයට පහරදීමේ සිද්ධියට අත්අඩංගුවට ගන්නා ලද පැමිණිලිකරුගේ පියාට අමතරව ඔහුගේ පුතුන් දෙදෙනාගෙන් එක් අයෙකු සම්බන්ධ බවට මුල් පැමිණිල්ලේ සඳහන් වන නමුත් සිද්ධිය සම්බන්ධ නියම සැකකරු පොලිසිය විසින් හඳුනාගෙන නොමැත.

03. අදාළ හෝටලයට පහරදීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා ලද පැමිණිලිකරුගේ පියා වන ඩබ්.එම්.නිහාල් වීරක්කොඩි යන අය 2020.07.31 දින අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේ පැමිණිලිකරුද අධිකරණයට පැමිණ ඇති අතර, එහිදී නීතිඥවරයා විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් අධිකරණයට කරුණු දක්වා අදාළ සිද්ධිය සම්බන්ධයෙන් ඔහු අවශ්‍ය සැකකරුවෙක් වන්නේ නම් අධිකරණයට ඉදිරිපත් කළ හැකි බව දන්වා ඇති අතර, එහිදී පොලිසිය සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරු සැකකරුවකු ලෙස නම්කර නොමැති බවත්, අදාළ සිද්ධියට සම්බන්ධ ඩබ්.එම්.නිහාල් වීරක්කොඩි යන අයගේ කුමන පුත්‍රයාද සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරි මඟින් තොරතුරු ලබාගෙන පැමිණිලිකරු අදාළ සිද්ධිය සිදුවූ දින මාදුරුඔය විශේෂ බලකා පුහුණු කඳවුරේ සේවයේ යෙදී සිටි බවට තහවුරු කරගත යුතු බවයි.

04. එහෙත් වගඋත්තර පාර්ශවීය පොලිස් නිලධාරීන් විසින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා ලද දිනය දක්වාම පැමිණිලිකරු සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරි මඟින් කිසිදු තොරතුරක් ලබාගැනීමක් හෝ මාදුරුඔය යුධහමුදා විශේෂ බලකා කඳවුරේ නිලධාරීන් මඟින් සිද්ධිය සිදුවූ දින පැමිණිලිකරු කඳවුරේ සේවයේ යෙදීම පිළිබඳව කිසිදු තොරතුරක් ලබාගෙන නොමැත.

05. 2020.08.17 දින මාතලේ අධිකරණ සංකීර්ණයේදී පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති අතර, අත්අඩංගුවට ගැනීමෙන් පසුව පැමිණිලිකරු විසින් ඔහු සන්තකයේ තිබූ මාදුරුඔය විශේෂ බලකා කඳවුරේ අණදෙන නිලධාරි විසින් 2020.08.16 දිනැතිව නිකුත් කර ඇති ලිපිය වගඋත්තර පාර්ශවීය පොලිස් නිලධාරීන් වෙත ඉදිරිපත් කර ඇති නමුත්, එහි සඳහන් පරිදි පැමිණිලිකරු අදාළ සිද්ධිය සිදුවූ දිනයේ කඳවුරේ රාජකාරියේ නියුතුව සිටි බවට වූ තොරතුරු පිළිබඳව කිසිදු විමසීමක් සිදුකර නොමැත.

06. පැමිණිලිකරු අත්අඩංගුවට ගත් අවස්ථාවේදි පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද ලිපිය පිළිබඳ මාදුරුඔය යුධහමුදා කඳවුරේ අණදෙන නිලධාරි මඟින් දුරකථන පණිවිඩයක් මගින් පැමිණිලිකරු සිද්ධිය වූ දිනයේ කඳවුරේ රාජකාරියේ යෙදී සිටි බවට තහවුරු කරගත්තේ නම්, පැමිණිලිකරු බන්ධනාගත කිරීමට අවශ්‍ය නොවේ.

07. තවද 2020.08.18 දිනැතිව මූලස්ථාන පොලිස් පරීක්ෂක මාතලේ විසින් අධිකරණයට දන්වා ඇත්තේ, වීරක්කොඩි මුදියන්සේලාගේ පුෂ්පික මේස බණ්ඩාර වීරක්කොඩි යන අය මෙම නඩුවෙන් මුදවා හැර හඳුනාගැනීමේ පෙරටවුව අවලංගු කරන ලෙසට ඉල්ලා ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

07. පැමිණිලිකරු අත්අඩංගුවට ගැනිමට පෙර අත්අඩංගුවට පත්වී ඇති අනුෂ්ක බංඩාර ඒකනායක යන අයගෙන් නිසි ලෙස විමර්ශන කටයුතු සිදුකර තොරතුරු ලබාගත්තේ නම්, මෙම සිද්ධියට සම්බන්ධ අවශ්‍ය නියම සැකකරු සොයා ගැනිමට අවස්ථාව තිබූ නමුත් පොලිසිය විසින් නිසි ලෙස කටයුතු නොකර අත්තනෝමතික ලෙස පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති බව තහවුරු වේ.

**නිගමනය :-**

අදාළ හෝටලයට පහරදීමේ සිද්ධියේ අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය ඩබ්.එම්.නිහාල් වීරක්කොඩි යන අයගේ පුත්‍රයා පිළිබඳ නිසි විමර්ශනයක් සිදුනොකර පැමිණිලිකරුව් අත්අඩංගුවට ගැනීම මඟින් පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති අත්තනෝමතික ලෙස අත්අඩංගුවට පත්නොවීමට ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවීය පොලිස් නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම වෙනුවෙන්, වගඋත්තර පාර්ශවීය

පොලිස් නිලධාරින්ට එරෙහිව පරීක්ෂණයක් සිදුකොට විනය ක්‍රියාමාර්ග ගැනිම සඳහා පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.02.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ආචාර්ය විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. Vijitha Nanayakkara**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත : 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

03. මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/